# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2025 විෂය නිර්දේශය

**නියාමක ප්‍රශ්න පත්‍රය**

## අදියර 01

# 1603 – ආර්ථික විද්‍යාව [ECN]

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
# 1603 - ආර්ථික විද්‍යාව (ECN)
# නියාමක ප්‍රශ්න පත්‍රය

**අයදුම්කරුවන්ට උපදෙස් (කරුණාකර අවධානයෙන් කියවන්න) :**

**දෙනු ලබන කාලයඃ**

- ලිවීම සඳහා පැය 03 යි.

**ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහයඃ-**

- A කොටස, B කොටස සහ C කොටස ලෙස කොටස් 3 කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විතය.
- සියළුම ප්‍රශ්නවලට උත්තර ලිවිය යුතුය.

**ලකුණුඃ**

- එක් එක් කොටස සඳහා වෙන්කර ඇති ලකුණු :

| කොටස | ලකුණු |
|---|---|
| A | 40 |
| B | 40 |
| C | 20 |
| **එකතුව** | **100** |

- එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු ප්‍රශ්නයත් සමඟ පෙන්වා ඇත. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා සමත්වීමේ ලකුණු 50 කි.

**උත්තරඃ**

- සියළුම උත්තර,සපයනු ලබන උත්තර පොත්වල ලිවිය යුතුය. ප්‍රශ්නපත්‍රවල ලියනු ලබන උත්තර ලකුණු දීම් සඳහා ඇගයීමට ලක් නොකරනු ඇත.
- එක් එක් ප්‍රශ්නය සඳහා ඔබේ උත්තරය අළුත් පිටුවකින් ආරම්භ කරන්න.
- සියලුම පෙර වැඩ පැහැදිලිව පෙන්නුම් කළ යුතුය.
- තීරුවල උත්තර නොලිවිය යුතුය.

**උත්තර පොත්ඃ**

- එක් එක් උත්තර පොතේ මුල් පිටුවේ උපදෙස් පෙන්වා ඇත.

**ගණකයන්ත්‍රඃ**

- සංකේත වීජගණිතමය හා අවකලනය සඳහා පහසුකම් සලසා ඇති ඒවා හැර ඕනෑම ගණක යන්ත්‍රයක් අයදුම්කරුවන්ට භාවිත කිරීමට අවකාශය ඇත. වැඩසටහන් කළ හැකි ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.

**ඇමුණුම්ඃ-**

- කළයුතු ක්‍රියා පරීක්‍ෂා ලැයිස්තුව. එක් එක් ප්‍රශ්නය (වාස්තවික පරීක්‍ෂා ප්‍රශ්න හැර) කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ දී ඇති නිර්වචනය මත පදනම්ව අයදුම්කරුවන් විසින් උත්තර සැපයිය යුතුය.

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**
**අනිවාර්ය ප්‍රශ්න විස්ස (20) කි.**

**A කොටස**

(මුළු ලකුණු 40)

**01 වන ප්‍රශ්නය**

අංක **1.1** සිට **1.10** දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදිම උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය, ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.

1.1 මිනිස් අවශ්‍යතා සහ වුවමනා සපුරාලීම සඳහා සම්පත් සීමිත ලෙස පැවතීම හඳුන්වනු ලබන්නේ:

(1) ආවස්ථික පිරිවැය ලෙසය. (2) හිඟකම ලෙසය.

(3) ආර්ථික පිරිවැය ලෙසය. (4) තේරීම ලෙසය.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, ආර්ථිකයක නිශ්පාදන හැකියා මායිම් වක්‍රය දකුණට විතැන්වීමට හේතුවක් වන්නේ කුමක්ද?

(1) පවතින සම්පත් ප්‍රමාණයේ අඩු වීමක්.

(2) පුහුණු ශ්‍රමය සංක්‍රමණය වීම.

(3) තාක්ෂණික දියුණුව.

(4) බෝවන රෝගයක් හේතුවෙන් වැඩ කරන පැය ගණන අඩු වීම.

1.3 පහත සඳහන් ඒවා අතුරෙන්, තිරසාර සංවර්ධන පැතිකඩෙහි ඇතුලත් අයිතමයක් **නොවන්නේ** කුමක්ද?

(1) සමාජ සංචලතාවය. (2) සාධාරණත්වය.

(3) සෞඛ්‍ය තත්ත්වය. (4) සහභාගීත්වය.

**1.4** භාණ්ඩයක් සඳහා වන පහත සඳහන් ඉල්ලුම් ශ්‍රිතය (Qd) සහ සැපයුම් ශ්‍රිතය (Qs) ඔබ වෙත ලබා දී ඇත.

$$Q_d = 2,800 - 25p$$
$$Q_s = -200 + 100p$$

භාණ්ඩයේ සමතුලිත මිල වන්නේ:

(1) රු.24/-. (2) රු30/-. (3) රු.25/-. (4) රු.50/-.

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, "පාරිභෝගික අතිරික්තය" විස්තර කරනු ලබන වාක්‍ය තෝරන්න:

(1) නිෂ්පාදකයින් අය කිරීමට කැමති මිල සහ ඔවුන් සත්‍ය වශයෙන් විකුණනු ලබන මිල අතර වෙනස වේ.

(2) පාරිභෝගිකයින් විසින් භාණ්ඩ සඳහා ගෙවීමට කැමති මුළු මුදල සහ ඔවුන් සත්‍ය වශයෙන්ම ගෙවූ මුළු මුදල අතර වෙනස වේ.

(3) ඉල්ලුම් ප්‍රමාණය, සැපයුම් ප්‍රමාණයට වඩා වැඩිවූ විට එය හට ගනී.

(4) සැපයුම් ප්‍රමාණය, ඉල්ලුම් ප්‍රමාණයට වඩා වැඩි වූ විට එය හට ගනී.

1.6 භාණ්ඩයක් පරිභෝජනය කිරීමෙන් පුද්ගලයෙකු ලබන තෘප්තිය හඳුන්වන්නේ:

(1) ආන්තික උපයෝගීතාව ලෙසයි. (2) ආවස්ථික පිරිවැය ලෙසයි.

(3) උපයෝගීතාව ලෙසයි. (4) මුළු උපයෝගීතාවය ලෙසයි.

1.7 2024 සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික සමාලෝචනයට අනුව, 2024 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම වූයේ:

(1) US $ 4,000. (2) US $ 4,516.

(3) US $ 3,685. (4) US $ 3,379.

1.8 පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකාවේ පූර්ණ තරඟකාරී වෙළඳපොළකට ආසන්නතම උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) වී වෙළෙඳපොළ. (2) සහල් වෙළෙඳපොළ.

(3) විදුලි බල වෙළෙඳපොළ (4) ඖෂධ වෙළෙඳපොළ

1.9 පහත සඳහන් ඒවා අතුරෙන්, පූර්ණ තරඟකාරී වෙළඳ පොළ ලක්ෂණයක් **නොවන්නේ** කුමක්ද?

(1) ආයතනවලට මිල පාලනය කළ නොහැක.

(2) ආයතන සතුව වෙළඳපොළට සැපයීම් කිරීමට තනි නීතිමය අයිතියක් පවතී.

(3) ආයතනය විසින් විකුණන නිශ්පාදිත, සමජාතිය වේ.

(4) වෙළෙඳපොළට ආබාධ ප්‍රවේශයක් ඇත.

1.10 භාණ්ඩ දෙකක් අතර හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන වේ නම් එම භාණ්ඩ 2 ක හඳුන්වන්නේ:

(1) බාල භාණ්ඩ ලෙසයි. (2) අනුපූරක භාණ්ඩ ලෙසයි.

(3) ආදේශක භාණ්ඩ ලෙසයි. (4) සාමාන්‍ය භාණ්ඩ ලෙසයි.

අංක **1.11** සහ **1.12** ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුල දී ඇති උත්තර දෙක අතුරින්, නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.

1.11 නිමැවුම් ඒකකයක් වැඩිපුර නිෂ්පාදනය කිරීම සඳහා දරනු ලබන අමතර පිරිවැය හඳුන්වනු ලබන්නේ (සාමාන්‍ය/ ආන්තික) .................................... පිරිවැය වශයෙනි.

1.12 ලාභය යනු ............................... (ප්‍රාග්ධනය / ව්‍යවසායකත්වය) සඳහා වන ප්‍රතිලාභය වේ.

අංක **1.13** සහ **1.14** ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍ය** දැයි දක්වන්න. සත්‍ය හෝ අසත්‍ය යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.

1.13 පිලිප්ස් වක්‍රය (Phillips Curve), උද්ධමනය සහ විරැකියාව අතර ධනාත්මක සම්බන්ධතාවයක් පැහැදිලි කරනු ලබයි.

1.14 පාරිභෝගික ආදායම ඉහළ යන විට, මුදල් සඳහා ඇති ඉල්ලුමද වැඩි වේ.

අංක **1.15** සිට **1.20** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංකයද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.

1.15 පරිමාණුකූල ඵලවල අදියර දෙකක් (02) ලැයිස්තුගත කරන්න.

1.16 ජාත්‍යන්තර වෙළඳාමේ ආරක්ෂණවාදී ක්‍රම දෙකක් (02) සඳහන් කරන්න.

1.17 නම්‍යශීලී විනිමය අනුපාතිකය යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

1.18 ජාතික ආදායම් ගිණුම්කරණයේ ප්‍රවේශයන් දෙකක් (02) ලැයිස්තුගත කරන්න.

1.19 ඒකාධිකාරයක ලක්ෂණ දෙකක් (02) ලැයිස්තුගත කරන්න.

1.20 හොඳ මුදලක ලක්ෂණ දෙකක් (02) ක් සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 40 )

**A කොටසෙහි අවසානය**

**අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.**

(මුළු ලකුණු 40)

**B කොටස**

**02 වන ප්‍රශ්නය**

(a) "ආර්ථික සම්පත් " සහ "ආර්ථික නොවන සම්පත්"අතර වෙනස්කම් දෙකක් (02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(b) නිශ්පාදන හැකියා මායිම් වක්‍රයේ (PPC) උපකල්පන තුනක් (03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(c) වෙළඳපොළ ආර්ථියක් මූලික ආර්ථික ප්‍රශ්න විසඳාගන්නා ආකාරය **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 10)

**03 වන ප්‍රශ්නය**

(a) සැපයුම් වක්‍රය වමට විතැන් වීමට හේතුවන සාධක තුනක් (03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(b) වෙළෙඳපොළ බලවේග මඟින් භාණ්ඩයක සමතුලිත මිල තීරණය කරන ආකාරය ප්‍රස්තාරයක් ආධාරයෙන් **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) සැපයුම් නීතිය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

**04 වන ප්‍රශ්නය**

(a) රජය විසින් භාණ්ඩයක් සඳහා අවම නීත්‍යානුකූල මිලක් පැනවීමෙන් ඇතිවන බලපෑම් **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) ඒකාධිකාරී ආයතනයක්, ලාභය උපරිම කරගන්නා ආකාරය ප්‍රස්තාරයක් භාවිතයෙන් **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) "මානව සංවර්ධනය දර්ශකය, සංවර්ධනය මනින පිළිබඳ වඩාත් සංකීර්ණ මිනුමක් ලෙස සැලකේ." ඉහත ප්‍රකාශය **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

**05 වන ප්‍රශ්නය**

(a) මූල්‍ය අතරමැදිකරුවන්ගේ කාර්යභාරය **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) මුදලේ කාර්යභාරයන් දෙකක් (02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(c) වාණිජ බැංකුවල ද්‍රවශීලතාවය සහ ලාභදායීත්වය අතර සම්බන්ධතාවය **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

**B කොටසෙහි අවසානය**

**අනිවාර්ය ප්‍රශ්නයකි.**

(මුළු ලකුණු 20)

**C කොටස**

## 06 වන ප්‍රශ්නය

(A) කිසියම් ආර්ථිකයක වසරක කාලයක් සඳහා ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් උපකල්පිත දත්ත ඔබ වෙත ලබා දී ඇත:

| | **රු. මිලියන** |
|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම | 4,000 |
| රාජ්‍ය පරිභෝජන වියදම | 6,000 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 2,500 |
| තොග වෙනස්වීම් | 400 |
| වටිනාකම් වෙනස්වීම් | 320 |
| භාණ්ඩ හා සේවා අපනයන | 5,200 |
| භාණ්ඩ හා සේවා ආනයන | 14,500 |
| විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම | 700 |

**ඔබ විසින් කළයුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න:**

(a) වෙළඳපොළ මිලට දළ දේශීය වියදම [Gross Domestic Expenditure (GDE) ]. (ලකුණු 03)

(b) වෙළඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 02)

(c) වෙළඳපොළ මිලට දළ දේශීය ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 02)

(B) 2020 සහ 2023 අතර කාලය තුළ, ශ්‍රී ලංකා රුපියල එක්සත් ජනපද ඩොලරයට සහ යූරෝවලට එරෙහිව අවප්‍රමාණ විය.
ඉහත කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතය පහළ යාමට හේතු හතරක් (04) ක් **සඳහන් කරන්න.** (ලකුණු 04)

(C) විශේෂයෙන්ම 2019න් පසු ශ්‍රී ලංකා ආර්ථිකය අවපාතයකට මුහුණපාන ලදී.

මෙම ආර්ථික පිරිහීමට හේතු වූ කරුණු දෙකක් (02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(D) ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම සඳහා ආර්ථිකයක් විසින් පිස්කල් ප්‍රතිපත්තිය භාවිතා කරන ආකාර දෙකක් (02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(E) දෙවන සහශ්‍රය තුළ, ශ්‍රී ලංකා රජය විසින් පිස්කල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ අඩුපාඩු දෙකක් (02) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 20)

**C කොටසෙහි අවසානය**

# කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| මට්ටම | ක්‍රියා ලැයිස්තුව | නිර්වචනය | සිසුන් සඳහා විස්තරාත්මක උපදෙස් |
|---|---|---|---|
| **මතක තබා ගැනීම**<br><br>කරුණු,පද,මූලික සංකල්ප හෝ පිළිතුරු, ඒවායේ තේරුම නිසි ලෙස තේරුම් නොගෙන සිහිපත් කිරීම වේ | හඳුනා දක්වන්න. | කෙනෙකුගේ හෝ යමක් හඳුනා දැක්වීම. | මාතෘකාවේ ප්‍රධාන කොටස් සොයා නම් කරන්න. |
| | නිර්වචනය කරන්න. | වචනයක් හෝ සංකල්පයක් තේරුම් ගැනීම. | පදයක හෝ සංකල්පයක පැහැදිලි අර්ථයක් ලබා දීම. |
| | හඳුනා ගන්න | පෙර දැක නොමැති දෙයක් පිළිබඳ දැනුවත්භාවය. | පෙර ඉගෙනීම්වලින් යමක් සොය දැන ගැනීම. |
| | සඳහන් කරන්න | පැහැදිලි සහ සංක්ෂිප්ත ලෙස තොරතුරු ප්‍රකාශ කිරීම. | ප්‍රධාන කරුණු හෝ සංකල්ප සරල ආකාරයෙන් ප්‍රකශ කිරීම. |
| | ලැයිස්තුගත කරන්න | නම්, සංඛ්‍යා හෝ අයිතම මාලාවක්. | ප්‍රධාන කරුණු සංවිධානාත්මකව ලිවීම. |
| | සටහන් කරන්න | පද්ධතියකට (ගිණුම්කරණය නොවේ) තොරතුරු ඇතුලත් කිරීම. | අදාල විස්තර පැහැදිලිව හා නිවැරදිව ඇතුලත් කිරීම. |
| **අවබෝධය**<br><br>තොරතුරුවල අර්ථය අවබෝධ කර ගැනීම සහ ඒවා අර්ථකථනය කිරීමට හෝ පැහැදිලි කිරීමට හැකිවීම | ගොඩ නගන්න | මූලිකාංග ඒකාබද්ධ කිරීමෙන් යමක් ගොඩ නැගීම. | විවිධ කොටස් මගින් සමස්ථයක් ලෙස අර්ථවත් බවට පත් කිරීම. |
| | වෙනස් කොට දක්වන්න | දේවල් දෙකක් හෝ වැඩි ගණනක් අතර වෙනස්කම් හඳුනා ගැනීම. | සංකල්ප හෝ අයිතම අතර වෙනස්කම් අවධාරණය කිරීම. |
| | විමසන්න | මාතෘකාවක් පිළිබඳව විවිධ අදහස් සහ මත සලකා බැලීම. | විවිධ දෘෂ්ටිකෝණ ගවේශණය කර අවබෝධයක් ලබා දීම. |
| | පැහැදිලි කරන්න | යමක් පිළිබඳව වඩාත් විස්තරාත්මකව පැහැදිලි කිරීම. | තාර්කික සහ සවිස්තරාත්මක මත විස්තරයක් සැපයීම. |
| | ගෙනහැර දක්වන්න | කරුණක් පැහැදිලි කිරීම සඳහා උදාහරණ, ප්‍රස්ථාර හෝ දෘශ්‍ය භාවිතය. | සුදුසු උදාහරණ හෝ දෘශ්‍ය මාධ්‍ය සමග පැහැදිලි කිරීම් සඳහා සහය වීම. |
| | අර්ථකථනය කරන්න | තොරතුරු හෝ ක්‍රියාවන්හි අර්ථය පැහැදිලි කිරීම. | යමකින් අදහස් වන්නේ කුමක්දැයි ඔබේ වචනවලින් පැහැදිලි කිරීම. |
| | විස්තර කරන්න | යම්කිසි දෙයක් පිළිබඳව සවිස්තරාත්මක විස්තරයක්. | අදාල විස්තර ව්‍යුහගත ආකාරයට සැපයීම. |
| | සාරාංශගත කරන්න | ප්‍රධාන කරුණු පිළිබඳව කෙටි ප්‍රකාශයක්. | සංක්ෂිපතව ඉදිරිපත් කිරීම. |

| මට්ටම | ක්‍රියා ලැයිස්තුව | නිර්වචනය | සිසුන් සඳහා විස්තරාත්මක උපදෙස් |
| --- | --- | --- | --- |
| **භාවිතය**<br><br>අළුත් සහ සංකීර්ණ තත්වයන් යටතේ උගත් දැනුම භාවිතා කිරීම වන අතර මේ සඳහා දැනුම සහ කුසලතා ප්‍රායෝගිකව භාවිතා කිරීම අවශ්‍ය වේ. | භාවිත කරන්න. | යම්කිසි තත්වයන් තුළ දැනුම කුසලතා හෝ රීතීන් භාවිතා කිරීම. | ප්‍රතිඵල ලබාදීම සඳහා අදාල දැනුම හෝ ශිල්පීය ක්‍රම භාවිතා කිරීම. |
| | ගණනය කරන්න. | ගණිතමය හෝ තාර්කික ක්‍රම මගින් අගය තීරණය කිරීම. | විසඳුමක් ලබා ගැනීම සඳහා සංඛ්‍යාත්මක හෝ තාර්කික ක්‍රියාවලීන් පැහැදිලි කිරීම. |
| | තීරණය කරන්න | පර්යේෂණ හෝ ගණනය කිරීම් හරහා යමක් ස්ථාපිත කිරීම. | ගණනය කිරීමෙන් හෝ පර්යේෂණයකින් පසු යමක් සොයාගැනීම හෝ නිගමනය කිරීම. |
| | ප්‍රදර්ශනය කරන්න. | ක්‍රියාවලිය හෝ ක්‍රමය ප්‍රදර්ශනය කිරීම. | ව්‍යුහගත පියවර හරහා පැහැදිලි උදාහරණයක් පෙන්වීම. |
| | පිළියෙල කරන්න. | භාවිතය සඳහා ද්‍රව්‍ය හෝ තොරතුරු සංවිධානය කිරීම. | කාර්යයක යෙදීමට පෙර අවශ්‍ය විස්තර සකස් කිරීම. |
| | භාවිත කරන්න | සංකල්පයන් මෙවලමක් හෝ ක්‍රමයන් අරමුණක් සඳහා භාවිතා කිරීම. | අදාල දැනුම හෝ සම්පත් යෝග්‍ය පරිදි භාවිතා කිරීම. |
| | ඉදිරිපත් කරන්න. | සඵලදායී ලෙස තොරතුරු බෙදා ගැනීම. | මූලික දැනීම සහ අවබෝධයන් පැහැදිලිව සහ වෘත්තීමය වශයෙන් ඉදිරිපත් කිරීම. |
| **විශ්ලේෂණය**<br><br>ව්‍යුහය සහ සම්බන්ධතා අවබෝධ කරගැනීම සඳහා තොරතුරු කුඩා සංරචකවලට වෙන් කිරීම | විශ්ලේෂණය කරන්න. | සංරචක අවබෝධ කරගැනීම සඳහා විස්තරාත්මකව පරීක්ෂා කිරීම. | වඩා හොඳ අවබෝධයක් සඳහා තොරතුරු ප්‍රධාන කොටස්වලට බෙදීම. |
| | සසඳන්න | සමානකම් සහ /හෝ වෙනස්කම් පරීක්ෂා කිරීම. | ප්‍රධාන පොදු ලක්ෂණ සහ වෙනස්කම් පෙන්වා දීම. |
| | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකින් වෙනස් කොට හඳුනා ගැනීම. | යමක් එකිනෙකට වෙනස් වන්නේ කුමකින්ද යන්න හඳුනා ගැනීම. |
| | පරීක්ෂා කරන්න | යමක ස්වභාවය තීරණය කිරීම සඳහා එය පරීක්ෂා කිරීම. | යමක් හොඳින් තේරුම් ගැනීම සඳහා එය හොඳින් නිරීක්ෂණය කිරීම. |
| | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. | ප්‍රධාන අංශ පිළිබඳව සංවිධානාත්මක දල විශ්ලේෂණයක් ලබා දීම. |
| | ක්‍රියා කරන්න | අත්හදා බැලීමක්, සමීක්ෂණයක් හෝ අධ්‍යනයක් සඳහා මූලිකාංග සංවිධානය කිරීම. | කාර්යයන් ක්‍රමානුකූලව සිදු කිරීම සඳහා ව්‍යුහාත්මක පියවර අනුගමනය කිරීම. |
| | වාර්තා කරන්න | සොයාගත් දෑ ව්‍යුහාත්මකව ඉදිරිපත් කිරීම. | විශ්ලේෂණය කළ තොරතුරු පැහැදිලි හා තාර්කික ආකෘතියකින් ඉදිරිපත් කිරීම. |

| මට්ටම | ක්‍රියා ලැයිස්තුව | නිර්වචනය | සිසුන් සඳහා විස්තරාත්මක උපදෙස් |
|---|---|---|---|
| **අගය කරන්න**<br><br>නිර්ණායක හෝ ප්‍රමිතීන් මත පදනම්ව අදහස් හෝ ද්‍රව්‍යයන් වල වටිනාකම හෝ ගුණාත්මක භාවය පිළිබඳව විනිශ්චයන් සිදු කිරීම. | උපදෙස් දෙන්න | යෝජනා හෝ නිර්දේශ ඉදිරිපත් කිරීම | විශ්ලේෂණ මත පදනම්ව දැනුවත් මග පෙන්වීමක් ලබා දීම. |
| | අගය කරන්න | වටිනාකම් සඵලදායීතාවය හෝ බලපෑම පිළිබඳව විවේචනාත්මකව තක්සේරු කිරීම. | නිර්ණායක මත පදනම්ව යම් දෙයක ගුණාත්මකභාවය හෝ අදාලත්වය නිශ්චය කිරීම. |
| | සකස් කරන්න | ව්‍යුහගත ප්‍රවේශයන් හෝ සැලැස්මක් සංවර්ධනය කිරීම. | හොඳින් අර්ථ දක්වන ලද ක්‍රමෝපායන් හෝ උපාය මාර්ගයන් සකස් කිරීම. |
| | නිර්දේශ කරන්න | සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනා කිරීම. | තාර්කික කරුණු මගින් සහායවන ප්‍රවේශයන් යෝජනා කිරීම. |
| **නිර්මාණය කිරීම**<br><br>සුසංයෝගී හෝ ක්‍රියාකාරී සමස්තයක් සෑදීම සඳහා නව ආකාරවලින් මූලද්‍රව්‍ය ඒකාබද්ධ කිරීම නව අදහස්, නිෂ්පාදන හෝ අවබෝධ කර ගැනීමේ ක්‍රම ජනනය කිරීමේ හැකියාව | නිර්මාණය කරන්න | අළුත් දෙයක් නිර්මාණය කිරීම. | අපූර්ව සහ අරමුණු සහගත යමක් සංවර්ධනය කිරීම. |
| | තක්සේරු කරන්න | ගුණාත්මක භාවය, හැකියාව හෝ ස්වභාවය තක්සේරු කිරීම හෝ ඇගයීම. | පවතින තොරතුරු මත පදනම්ව තර්කාණුකූල විනිශ්චයන් ලබා දීම. |
| | සංවර්ධනය කරන්න | අදහසක්, නිශ්පාදනයක් හෝ සංකල්පයක් පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම. | කාලයත් සමගින් අදහස ශක්තිමත් හා වැඩි දියුණු කිරීම. |
| | යෝජනා කරන්න | සලකා බැලීම සඳහා වන සැලැස්මක් හෝ සංකල්පයක් පිළිබඳ යෝජනා කිරීම. | අදහසක් හෝ ව්‍යුහගත නිර්දේශයක් ඉදිරිපත් කිරීම. |
| | සංයෝජනය කරන්න | විවිධ සංරචකයන්ගේ සංයෝජනය මගින් සංගත සමස්ථයක් නිර්මාණය කිරීම. | විවිධ අදහස් හෝ අවබෝධයන් අර්ථවත් වූ නිගමනයකට ඒකාබද්ධ කිරීම. |
| | සැලසුම් කරන්න | යමක් සඳහා ව්‍යුහගත සැලැස්මක් නිර්මාණය කිරීම. | නිශ්පාදනයක් හෝ ක්‍රියාවලියක් සඳහා සවිස්තරාත්මක ව්‍යුහයන් සකස් කිරීම. |
| | ගොනු කරන්න | විවිධ මූලාශ්‍රයන්ගෙන් තොරතුරු එක් රැස් කිරීම. | එකතු කරන ලද දත්ත පුළුල් ආකෘතියකට සංවිධාන කිරීම. |

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2025 විෂය නිර්දේශය

## ආදර්ශ විසඳුම්

## අදියර 01

# 1603 – ආර්ථික විද්‍යාව [ECN]

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**
**අනිවාර්ය ප්‍රශ්න විස්ස(20) කි.**

(මුළු ලකුණු 40)

**A කොටස**

**1 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1.1 | (2) | 1.6 | (3) | 1.11 | ආන්තික |
| 1.2 | (3) | 1.7 | (2) | 1.12 | ව්‍යවසායකත්වය |
| 1.3 | (2) | 1.8 | (1) | 1.13 | අසත්‍ය |
| 1.4 | (1) | 1.9 | (2) | 1.14 | සත්‍ය |
| 1.5 | (2) | 1.10 | (3) | | |

**(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 28)**

1.15
- වැඩෙන පරිමාණුකූල ඵල.
- හීනවන පරිමාණුකූල ඵල.
- ස්ථාවර පරිමාණුකූල ඵල. **(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 02)**

1.16
- තීරුබදු.
- කෝටා ක්‍රමය.
- සහනාධාර.
- අපනයන මත ස්වේච්ඡාවෙන් පනවන සීමාවන්.
- විදේශ විනිමය පාලනය.
- පරිපාලන තාක්‍ෂණික ප්‍රමිතීන් නියම කිරීම.
- ආර්ථික සම්බාධක පැනවීම. **(එකකට ලකුණු 01 බැගින් ලකුණු 02)**

1.17 නම්‍යශීලී විනිමය අනුපාතිකයක් යනු ඉල්ලුම හා සැපයුම යන වෙලඳපොළ බලවේග මඟින් විනිමය අනුපාතිකය තීරණය කිරීමට ඉඩ සලසන ක්‍රමවේදයයි. **(ලකුණු 02)**

1.18
- ආදායම් ප්‍රවේශය.
- නිමැවුම් ප්‍රවේශය.
- වියදම් ප්‍රවේශය. **(එකකට 01 බැගින් ලකුණු 02)**

1.19 - වෙළඳපොලේ එක් ආයතනයක් පමණක් තිබීම.

- මිල තනන්නෙකු වීම.

- ඉල්ලුම් වක්‍රය පහලට බෑවුම් වීම.

- ආසන්න ආදේශක භාණ්ඩ නොමැති වීම / නිෂ්පාදිතය සුවිශේෂී වීම.

- ප්‍රවේශයට බාධා පැවතීම.

**(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 02)**

1.20 - පිළිගත හැකි බව.

- හඳුනා ගැනිමට පහසු විම.

- පහසුවෙන් රැගෙන යාමට හැකිවීම.

- කුඩා ඒකක වලට බෙදිය හැකි වීම.

- ඒකාකාරි බව.

**(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 02)**

**(මුළු ලකුණු 40)**

***A කොටසේ අවසානය***

| අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි. <br> (මුළු ලකුණු 40) | **B කොටස** |
|---|---|

**2 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

**1 වන ඒකකය - ව්‍යාපාර පරිසරය සඳහා ආර්ථික සංකල්ප හා ආර්ථික පද්ධති**

ඉගෙනුම් ප්‍රතිපල - ආර්ථිකයක් විසින් අසීමිත අවශ්‍යතා සහ උවමනා සඳහා හිඟ සම්පත් වෙන් කරන ආකාරය හඳුනාගැනීම හා පැහැදිලි කිරීම. (හිඟකම තේරීම ආවස්ථයික පිරිවැය, නිශ්පාදන හැකියා මායිම, කාර්යක්ෂමතාවය හා සාධාරණත්වය ඇතුළුව).

- භාණ්ඩ හා සේවා නිශ්පාදනය සඳහා භාවිතා කරන ආර්ථික සම්පත් සහ ආර්ථික නොවන සම්පත් හඳුනා ගැනීම.
- විවිධ ආර්ථිකයන් විසින් කුමක් නිශ්පාදනය කළ යුතුද කෙසේ නිශ්පාදනය කළ යුතුද සහ කා හට නිෂ්පාදනය කළ යුතුද යන මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම පැහැදිලි කිරීම.

**(a)**

| | | **ආර්ථිකමය** | **ආර්ථික නොවන** |
|---|---|---|---|
| 1. | වටිනාකම | මුල්‍යමය වටිනාකමක් ඇත. | මුල්‍ය වටිනාකමක් නොමැත. |
| 2. | භාවිතය | භාණ්ඩ සහ සේවා නිපදවීම සඳහා භාවිතා කරයි. | නිෂ්පාදනයේදී සෘජුවම භාවිතා නොවේ. |
| 3. | පවතින ප්‍රමාණය | සීමිත වන අතර වෙන්කොට භාවිතා කළ යුතුය. | නිදහසේ ලබාගත හැකි වේ. |
| 4. | හිඟකම | හිඟ වේ. / සැපයුම සීමිත වේ. | හිඟ නොවේ./ බහුලව පවතී. |

**(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 02)**

**(b)** - භාණ්ඩ දෙකක් පමණක් නිපදවිය හැකිය. (උදා- ආහාර සහ ඇඳුම්)

- සලකා බලනු ලබන කාල සීමාව තුළ පවතින සම්පත් ප්‍රමාණය ස්ථාවර වේ.
- තාක්ෂණය වෙනස් නොවේ.
- පවතින සියළුම සම්පත් පූර්ණ ලෙස සහ උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිතා කරනු ලැබේ.

**(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 03)**

**(C)** වෙළෙඳපොළ ආර්ථිකය තුළ සැපයුම සහ ඉල්ලුම මත පදනම්ව පුද්ගලයන් සහ ආයතන මගින් තීරණය ගනු ලැබේ. පාරිභෝගික කැමැත්ත මත නිෂ්පාදනය කරන්නේ කුමක්ද යන ප්‍රශ්නය තීරණය වන අතර ලාභදායී භාණ්ඩ නිෂ්පාදනය කර සපයනු ලබයි. මෙම ක්‍රමය මගින් භාණ්ඩ හා සේවා වල සාපේක්ෂ මිල සහ ලාභදායීත්ව හරහා මෙම ප්‍රශ්නයට සපයනු ලබයි.

සාධක වෙළඳපොලේ සාධකවලට ඇති ඉල්ලුම හා සැපයුම අනුව ඇතිවන සාපේක්ෂ මිල ගණන් මත අපේක්ෂිත ලාභදායීත්වය සලකා බලා කුමන ශිල්ප ක්‍රමය යොදා ගන්නේද යන්න වෙළඳපොළ ආර්ථිකයක් විසින් තීරණය කරයි. මෙහිදී එම ප්‍රශ්නය විසඳීමේදී උපරිම ලාභදායීත්වය සහතික කරන අවම පිරිවැයක් සහිත ශිල්ප ක්‍රමය තෝරාගනු ලැබේ.

කවුරුන් වෙනුවෙන් නිෂ්පාදනය කළ යුතුද යන්න තීරණය වන්නේ පාරිභෝගිකයාගේ හැකියාව සහ ගෙවීමට ඇති කැමැත්ත අනුව, භාණ්ඩ සැපයෙන්නේ භාණ්ඩ මිලදී ගැනීමේ හැකියාව ඇති අය සඳහාය. ලාභ උපයා ගැනීම සඳහා ව්‍යවසායකයන් විසින්, මිලදී ගැනීමට හැකියාව ඇති පාරිභෝගිකයන් සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කළ යුතුය. **(ලකුණු 05)**

**(මුළු ලකුණු 10)**

**3 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුර**

**02 වන ඒකකය - ඉල්ලුම, සැපයුම, සමතුලිතය සහ රජයේ මැදිහත් වීම.**

ඉගෙනුම් ප්‍රතිඵල - ඉල්ලුම සහ සැපයුම තීරණය කරන සාධක පැහැදිලි කිරීම.

- වෙළඳපොළ තුලිතය (වෙළඳපොළ සමතුලිතය) සහ එහි ව්‍යාපාරවලට ඇති බලපෑම.

**(a)**
- සම්බන්ධිත භාණ්ඩවල මිල ඉහළ යෑම.
- නිෂ්පාදනය සඳහා භාවිතා වන සාධක යෙදවුම්වල මිල ඉහළ යාම.
- යල්පැන ගිය තාක්ෂණික ක්‍රම භාවිතය.
- වෙළෙඳපොලේ සැපයුම්කරුවන් සංඛ්‍යාව අඩු වීම.
- රජය මගින් නිෂ්පාදකයින් මත පනවන ලද බදු වැඩි කිරීම හෝ නව බදු පැනවීම.
- රජය විසින් නිෂ්පාදකයින්ට ලබා දෙන සහනාධාර ඉවත් කිරීම.
- අනාගතයේදී භාණ්ඩවල මිල ඉහළ යනු ඇතැයි නිෂ්පාදකයින් අපේක්ෂා කිරීම.

**(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 03)**

**(b)**



ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර මගින් පාරිභෝගිකයින් සහ සැපයුම්කරුවන් විවිධ මිල ගණන් මත ක්‍රියා කරන ඇකාරය පෙන්නුම් කෙරේ. $\mathbf{p_2}$ මිල යටතේ අධි සැපයුමක් පවතී. එවිට මිල පහළ යාමට පටන් ගනී. $\mathbf{p_1}$ හිදී අධි ඉල්ලුමක් ඇති අතර මිල ඉහළ යාමක් සිදුවේ. එවිට ඉල්ලුම හා සැපයුම් වක්‍ර E ලක්ෂයේදී ඡේදනය වේ. මෙම අවස්ථාවේ ඉල්ලුම = සැපයුම වේ. එවිට P යනු සමතුලිත මිල වේ. **(ලකුණු 04)**

**(c)** යම් කාල පරිච්ඡේදයක් තුළදී අදාල භාණ්ඩයේ මිල හැර අනෙකුත් සාධක ස්ථාවරව පවතින විට එම භාණ්ඩයේ මිල සහ සැපයුම් ප්‍රමාණය අතර පවතින ධනාත්මක සම්බන්ධතාවය සැපයුම් නීතිය මගින් පැහැදිලි කෙරේ. **(ලකුණු 03)**

**(මුළු ලකුණු 10)**

**4 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුර**

**2 වන ඒකකය - ඉල්ලුම, සැපයුම, සමතුලිතය සහ රජයේ මැදිහත් වීම.**

**3 වන ඒකකය - නිෂ්පාදන ක්‍රියාවලිය සහ විවිධ වෙළඳපොළ ව්‍යුහ.**

**7 වන ඒකකය - ආර්ථික වර්ධනය, සංවර්ධනය සහ නව ප්‍රවනතා**

ඉගෙනුම් ප්‍රතිඵල - රජයේ වෙළඳපොළ මැදිහත් වීමේ උපාය මාර්ග පැහැදිලි කිරීම.
- පූර්ණ තරගකාරී සහ ඒකාධිකාරී වෙළඳපොළවල ලාභ උපරිම කිරීම පැහැදිලි කිරීම (ප්‍රශස්ථ නිමැවුම හා මිල ඇතුළත්ව).
- මෑත කාලීන ප්‍රධාන සාර්ව ආර්ථික දර්ශක හඳුනා ගැනීම සහ ව්‍යාපාරවලට ඒවායේ අදාලත්වය පැහැදිලි කිරීම.

**(a) අවම නීත්‍යානුකූල මිලක් පැනවීම (මිල සීමාව)**

කිසියම් භාණ්ඩයක් විකිණීමට හැකි අවම මිල නිත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීම, අවම නිත්‍යානුකූල මිලක් පැනවීම ලෙස හැඳින්වේ. සමතුලිත මිලට වඩා ඉහලින් නිත්‍යානුකූල මිලක් නියම කිරීම, අවම නිත්‍යානුකූල මිලක් පැනවීම ලෙස හඳුන්වනු ලබන අතර රජය නිෂ්පාදිතයාගේ සහ නිෂ්පාදන සාධකවල හිමිකරුවන්ගේ යහ පැවැත්ම පිළිබඳව සැලකිලිමත් වන විට අවම මිල පනවනු ලැබේ. අවම නිත්‍යානුකූල මිලක් නියම කළ විට නීත්‍යානුකූලව නියම කරන ලද මිලට වඩා අඩු මිලකට දී ඇති අයිතමය හෝ දී ඇති සාධක යෙදවුම් මිලදී ගැනීම නීති විරෝධී වේ. අවම නීත්‍යානුකූල මිලක් හඳුන්වා දුන් විට වෙළඳපොල තුල අධි සැපයුමක් (අතිරික්තයක්) නිර්මාණය වේ. මෙමගින් වෙළඳ පොලේ අසමතුලිතතාවයක් ඇතිකරනු ලැබේ. වෙළඳපොලේ අධි සැපයුමක් පවතින විට රජය විසින් පනවන ලද අවම නිත්‍යානුකූල මිල පවත්වගෙන යාම දුෂ්කර වේ. මෙමගින් ආර්ථිකයේ හිඟ සම්පත් බෙදා හැරීමේ අකාර්යක්ෂමතාවයන් ඇති කරනු ලැබේ. මෙහිදී මිල යාන්ත්‍රණයට නිදහසේ ක්‍රියාත්මක වී වෙළඳපොල මිල ගැලපීම් සිදුකොට අතිරික්තය ඉවත් කිරීමට නොහැකිය. එබැවින් අවම නිත්‍යානුකූල මිල සාර්ථකව පවත්වා ගැනීම සඳහා වෙළඳපොලේ පවතින අතිරික්තය ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු වේ.




**(ලකුණු 04)**

**(b)**




ලාභය උපරිම කරන ලක්ෂ්‍යය - **F**

ඒකාධිකාරයක් තුළ, තනි ආයතනයක් සමීප ආදේශන වලින් තොරව භාණ්ඩයක් සඳහා වූ මුළු වෙළඳපොළම පාලනය කෙරේ. ලාභය උපරිම කර ගැනීම සඳහා ඒකාධිකාරය විසින් ආන්තික ආදායම, ආන්තික පිරිවැය ට සමාන වන නිමැවුම් මට්ටමින් නිෂ්පාදනය කෙරේ (MR = MC).

ඒකාධිකාරී ආයතනයේ ලාභ උපරිම කරනු ලබන සමතුලිත ලක්ෂ්‍යය F මගින් නියෝජනය කෙරේ. මෙම ලක්ෂ්‍යයේදී ආන්තික පිරිවැය (MC), ආන්තික ආදායමට (MR) සමාන වන අතර ලක්ෂයෙන් ඔබ්බට ආන්තික පිරිවැය ඉහළ ගොස් ආන්තික ආදායමට වඩා වැඩි වේ. එබැවින්, මෙම නිමැවුම් මට්ටම තුළ ක්‍රියාත්මක වන විට ආයතනයට තම ලාභය උපරිම කරගත හැකි වේ. **(ලකුණු 04)**

**(c)** මානව සංවර්ධන දර්ශකයට (HDI) ආයු අපේක්ෂාව (සෞඛ්‍යය), අධ්‍යාපනය සහ ඒක පුද්ගල ආදායම (GNI) ඇතුලත් වේ. මෙය දළ දේශීය නිෂ්පාදිතය වැනි ආර්ථික දර්ශකයන්ට වඩා ඔබ්බට ගොස් මානව යහපැවැත්ම පිළිබඳ වඩාත් පූර්ණ දැක්මක් ලබා දේ. එය මානව යහපත සඳහා පිළිගනු ලබන මිනුමක් වේ. සමාජීය සහ ආර්ථික දර්ශක ඒකාබද්ධ කිරීමෙන් මානව සංවර්ධන දර්ශකය මගින් ජනතාවගේ යහපැවැත්ම සහ ජීවන තත්වයන් පිළිබඳ සම්පූර්ණ දැක්මක් ලබා දේ. සැබෑ සංවර්ධනය යනු මූල්‍යමය ධනයට වඩා වැඩියමක් බව එමගින් අවධාරණය කෙරේ. **(ලකුණු 02)**

**(මුළු ලකුණු 10)**

**5 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

| | |
|---|---|
| **5 වන ඒකකය** | **- මූල්‍ය පද්ධති, මුදල් සහ මිල මට්ටම** |
| ඉගෙනුම් ප්‍රතිඵල | - මුදල්වල භූමිකාව (මුදල්වල කාර්යභාරය), එහි ඉල්ලුම සහ සැපයුම පැහැදිලි කිරීම.<br>- මූල්‍ය අතරමැදි ආයතන ව්‍යාපාර කටයුතුවලට උපකාරවන ආකාරය පැහැදිලි කිරීම.<br>- වාණිජ බැංකුවල ද්‍රවශීලතාවය සහ ලාභදායීත්වය අතර සහ සම්බන්ධතාව පැහැදිලි කිරීම. |

**(a)** මූල්‍ය අතරමැදියන් අතිරික්ත මුදල් ඇති ඒකකවලින් ණයට ගෙන මුදල් හිඟ ඒකකවලට ණයදීම යන අත්‍යාවශ්‍ය මූල්‍ය අතරමැදි කාර්ය ඉටුකරනු ලැබේ. මූල්‍ය අතරමැදිකරණය මගින් ආයෝජන සඳහා අරමුදල් සැපයීම, අවදානම් බෙදා හැරීම හරහා ණය අවදානම අවම කිරීම සහ සුමට ගෙවීම් ක්‍රියාවලියක් සක්‍රීය කිරීම මගින් ව්‍යාපාරවලට සහය වේ. ඔවුන් ව්‍යාපාර තීරණ වැඩිදියුණු කිරීමට උපකාරීවන මූල්‍ය උපදෙස් ද ලබා දේ. තවද, ඔවුන් අරමුදල් රැස් කිරීමෙන් අවදානම් අඩු කරන අතර ව්‍යාපාරවලට කාර්යක්ෂමව මූල්‍ය ප්‍රවේශය ලබාගැනීමට උපකාරී වේ. ඔවුන් විසින් ඉතිරි කරගන්නන්ගෙන් අරමුදල් ලබා ගෙන ණය ගැණුම්කරුවන් වෙත කාර්යක්ෂමව යොමුකරන බැවින් ඔවුන් ණය ගැනුම් පිරිවැය අඩුකරන අතර මූල්‍ය ප්‍රවේශය වැඩි දියුණු කරයි. මෙමගින් සමස්ත ව්‍යාපාර වර්ධනය හා ආර්ථික වර්ධනයට අනුබල දෙයි. **(ලකුණු 04)**

**(b)** **හුවමාරු මාධ්‍යයක් වීම:**

හුවමාරු මධ්‍යයක් ලෙස මුදල් භාවිතයත් සමඟ භාණ්ඩ හුවමාරු ක්‍රමයේ පැවති දුෂ්කරතා ඉවත් විය. මෙම ක්‍රියාවලියත් සමඟ ද්විත්ව වුවමනා සමපාත වීම, ප්‍රවාහන ගැටළු, ගබඩා කිරීම සහ කුඩා ඒකකවලට බෙදීමේ දුෂ්කරතා වැනි අඩුපාඩු ඉවත් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මුදල් අනෙකුත් වත්කම්වලින් පැහැදිලිව වෙන්කර හඳුනාගත හැකි විය. එමඟින් විකුණුම්කරුවන්ට භාණ්ඩ හා සේවා මුදල් සමඟ හුවමාරු කර ගැනීමටත් පසුව ඔවුන් කැමති ඕනෑම භාණ්ඩ හා සේවා ලබා ගැනීමටත් මුදල් භාවිතා කිරීමේ හැකියාව ලැබේ.

**වටිනාකමේ සන්නිධියක් ලෙස ක්‍රියා කිරීම:**

කිසිඳු අවධානමකින් තොරව අනාගතයේ භාවිතය සඳහා මුදල් ඉතිරිකිරීමේ හැකියාව මෙමගින් අදහස් කෙරේ.

**ගිණුම් ඒකකයක් ලෙස මුදල් යොදා ගැනීම (වටිනාකමේ මිනුමක්):**

භාණ්ඩ සඳහා මුදල් හුවමාරු කළහොත් එමගින් අදහස් වන්නේ භාණ්ඩවල මිල මුදල් මගින් තීරණය කරනු ලබන බවය. භාණ්ඩ හුවමාරු ක්‍රමය යටතේ තිරිඟු සඳහා ඇපල් සහ බිත්තර සඳහා මස් වැනි දහස් ගණනක් වූ විනිමය අනුපාත අවශ්‍ය වනු ඇත. සෑම දෙයක්ම මුදලින් මිල නියම කිරීම මගින් මෙම ගැටළු විසඳා ගැනීමට හැකියාව ලැබේ.

**විලම්භිත ගෙවුම් මාධ්‍යයක් වීම:**

ණය හෝ ණය ගිවිසුම් වැනි අනාගතයේදී ගෙවීම් කිරීමට මුදල් භාවිත කරන විට එය කල් පසුවී සිදුකරනු ලබන ගෙවීම් සඳහා මුදල් මිනුමක් ලෙස ක්‍රියා කරයි.

**(ලකුණු 1½ බැගින්, ලකුණු 03)**

**(C)** වාණිජ බැංකුවල ද්‍රවශීලතාවය සහ ලාභදායීත්වය අතර සාමාන්‍යයෙන් සෘණාත්මක සම්බන්ධතාවයක් පවතී. මූල්‍ය දුෂ්කරතා වළක්වා ගැනීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතාවයන් පවත්වා ගැනීම ඉතා වැදගත්වන අතර අධික ද්‍රවශීල වත්කම් තබා ගැනීමෙන් ආයෝජනය සහ ණය දීම මගින් ආදායම් උපයාගැනීමට බැංකුවට ඇති හැකියාව අඩු කරනු ලැබේ. මෙයින් අදහස් වන්නේ බැංකුවල ලාභ උපරිම කිරීමේ අවශ්‍යතාවය සමඟ ද්‍රවශීලතාවයේ අවශ්‍යතාව බැංකුව සමතුලිත කරගත යුතුය. **(ලකුණු 03)**

**(මුළු ලකුණු 10)**

***B කොටසේ අවසානය***

**අනිවාර්ය ප්‍රශ්න එක (01) කි.**

මුළු ලකුණු 20

**C කොටස**

**6 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුර**

**4 වන ඒකකය - ජාතික ගිණුම්කරණය හා ආර්ථික කළමනාකරණයේදී රජයේ කාර්යභාරය.**

**6 වන ඒකකය - ජාත්‍යන්තර වෙළඳාම සහ විදේශ විනිමය වෙළඳපොළ**

ඉගෙනුම් ප්‍රතිඵල - සාර්ව ආර්ථික අරමුණු හඳුනා ගැනිම සහ සාර්ව ආර්ථික අරමුණු සපුරා ගැනීම සඳහා ප්‍රතිපත්ති පැහැදිලි කිරීම.

- විවිධ අංශවල වෘත්තාකාර ආදායම් ප්‍රවාහයන් පැහැදිලි කිරීම.
- ෆස්කල් ප්‍රතිපත්ති උපකරණ සහ ව්‍යාපාරයන්ට එන බලපෑම පැහැදිලි කිරීම.
- විදේශ විනිමය වෙළඳපොළ සහ විනිමය අනුපාතිකය තීරණය කිරිම පැහැදිලි කිරීම.

**(A)**

| | | රු බිලියන |
|---|---|---|
| | පෞද්ගලික පරිභෝජන වියදම | 4,000 |
| | රජයේ පරිභෝජන වියදම | 6,000 |
| | දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 2,500 |
| | තොග වෙනස් වීම් | 400 |
| | වටිනාකම් වෙනස් වීම් | 320 |
| **(a)** | **වෙළඳපොළ වියදමට දළ දේශිය වියදම (GDE)** | **13,220** |
| | එකතු කළා: භාණ්ඩ හා සේවා අපනයනය | 5,200 |
| | අඩු කළා: භාණ්ඩ හා සේවා ආනයනය | (14,500) |
| **(b)** | **වෙළඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය** | **3,920** |
| | විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම | 700 |
| **(c)** | **වෙළඳපොළ මිලට දළ ජාතික ආදායම (GNI)** | **4,620** |

**(ලකුණු 07)**

**(B)** (1) විනිමය අනුපාතිකය කෘතිමව දිගු කාලයක් රඳවා තබා ගැනීම.

විනිමය අනුපාතිකය ඉල්ලුම හා සැපයුම සැලකිල්ලට නොගෙන ස්ථාවර කරන ලදී. පසුව එය පා කිරීමට සැලැස්වීමේ දී එහි ප්‍රතිඵලයක් වශයෙන් ඩොලර් අනුපාතය ඉහළ යන ලදී.

(2) ආනයන වියදම් සහ අපනයන ආදායම් අතර පරතරය.

ශ්‍රී ලංකාවේ ආනයන වියදම එහි අපනයන ආදායම ඉක්මවා යයි. එය වෙළඳ ගිණුමේ හිඟ ශේෂයක් ඇති කරනු ලබයි.

(3) පොළී අනුපාත උද්ධමනයට වඩා අඩුවෙන් පවත්වා ගැනීම, ඉතිරි කිරීම් වෙනුවට පරිභෝජනයට ජනතාව පෙළඹවීම.

(4) ගෙවුම් ශේෂ මූල්‍යනය කිරීම සඳහා විදේශ ණය මත දැඩි ලෙස යැපීම.

(5) ව්‍යාපෘති සඳහා ලබාගත් විදේශ ණය, වෙළඳ ගිණුමේ හිඟ පියවීම සඳහා යොදාගෙන ඇති අතර විදේශ සංචිත ණය පොළී ගෙවීම සඳහා යොදාගෙන ඇත.

(6) Covid 19 සමඟ විදේශ ශ්‍රමිකයන්ගෙන් ලැබෙන විදේශ ප්‍රේෂණ අඩු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස රටතුළ විදේශ විනිමය සැපයුම අඩු වී ඇත.

(7) අමුද්‍රව්‍ය හිඟය හේතුවෙන් ගෝලීය ආර්ථිකයේ තෙල් හා ගෑස් මිල ඉහළ යාම එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණ විය.

(8) Covid 19 වසංගතය හේතුවෙන් සංචාරක පැමිණීම විශාල ලෙස පහත වැටී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රටට උපයාගත හැකිව තිබූ විදේශ ආදායම අහිමි වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණ වී ඇත.

**(ලකුණු 01 බැගින්, ලකුණු 04)**

**(C)** 2019 වසරෙන් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනය සෘණ වූ අතර ඉහළ යන උද්ධමනය සහ පුළුල් හිඟතාවයන් මගින් දැඩි අවපාතයකට අවතීරණ විය. මෙම ආර්ථික පසුබෑමට ප්‍රධාන සාධක කිහිපයක් දායක විය.

(1) **COVID-19 වසංගතයේ බලපෑම** (2020 සිට) :

ශ්‍රී ලංකාවේ විදේශ ආදායම් උපයන ප්‍රධාන මූලාශ්‍ර වන සංචාරක, අපනයන සහ ප්‍රේෂණ වැනි ප්‍රධාන අංශවලට වසංගතය දැඩි ලෙස බලපාන ලදී. රට වසා දැමීම සහ ගෝලීය ඉල්ලුම පහත වැටීම මඟින් ආර්ථික ක්‍රියාකාරකම්වල දැඩි පසුබෑමට හේතු විය.

(2) **දුර්වල ආර්ථික කළමනාකරණය සහ ප්‍රතිපත්තිමය තීරණ:**

බදු කප්පාදුව රජයේ ආදායම් අඩු කිරීමට හේතු වූ අතර අයවැය හිගය පියවා ගැනීම සඳහා මුදල් මුද්‍රණය කිරීම උද්ධමනයට හේතු විය. අතිරේක වශයෙන් රසායනික පොහොර තහනම් කිරීම නිසා බෝග අස්වැන්න අඩුවූ අතර, ආහාර හිගයට සහ මිල ඉහළ යාමට හේතු විය.

(3) **විදේශ ණය අර්බුධය:**

සීමිත විදේශ සංචිත සමඟ ශ්‍රී ලංකාව වර්ධනය වන විදේශ ණය බරට මුහුණ දුන් අතර එය ස්වෛරී ණය අර්බුධයකට සහ ණය ආපසු ගෙවීමේ දුෂ්කරතාවයට හේතු විය.

(4) **දේශපාලන අස්ථාවරත්වය:**

නිරන්තරයෙන් සිදු වූ රජයේ වෙනස්වීම් සහ දේශපාලන නොසන්සුන්තාව ආයෝජකයන්ගේ විශ්වාසය අඩු කළ අතර ස්ථාවර ආර්ථික සැළසුම්කරණයට බාධා ඇතිකරනු ලැබූ අතර එමගින් ආර්ථික අවිනිශ්චිතතාවය වැඩි විය.

(5) **ගෙවුම් ශේෂ අර්බුධය:**

අපනයන ප්‍රේෂණ අභිබවා ආනයන සහ ණය ආපසු ගෙවීම් වැඩි වීම මගින් විදේශ මුදල් හිගයට රටට මුහුණු පෑමට සිදුවිය. මෙම හිගය නිසා ආනයන සඳහා ගෙවීමට සහ විදේශ ණය ගෙවීමට අපහසු වූ අතර ආර්ථික තත්වය බරපතල ලෙස අහිතකර අතට හැරුණි.

**(ලකුණු 01½ බැගින්, ලකුණු 03)**

**(D)** (1) **රාජ්‍ය වියදම් ඉහළ දැමීම:**

යටිතල පහසුකම්, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා සහ පොදු සේවා වැනි ක්ෂෙත්‍රවල ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීමෙන් රජයට ආර්ථික වර්ධනය දිරිමත් කළ හැකිය. මෙය ආර්ථිකයේ සමස්ත ඉල්ලුම ඉහළ නංවන අතර දිගුකාලීනව ඵලදායීතාවය ඉහළ නංවනු ලැබේ. $(Y = C + I + G + X - M)$.

(2) **බදු අඩු කිරීම:**

පුද්ගලයින් සහ සමාගම් සඳහා වන බදු අඩු කිරීම මගින් ජනතාවට වියදම් කිරීමට ඇති මුදල් වැඩිවන අතර ව්‍යාපාර වැඩි වැඩියෙන් ආයෝජනය කිරීමට පෙළඹේ. මෙමගින් පාරිභෝගික වියදම් හා ව්‍යාපාර ආයෝජන යන දෙකම ඉහළ නංවන අතර ඉල්ලුම සහ සැපයුම යන අංශ දෙකෙහි වර්ධනයට උපකාරී වේ.

(3) **ඉලක්කගත සහනාධාර සහ දිරිදීමනා ලබා දීම:**

රජයට ගොවිතැන, පුනර්ජනනීය බලශක්තිය සහ තාක්‍ෂණය වැනි වැදගත් කර්මාන්ත සඳහා මුල්‍යාධාර හෝ ප්‍රදාන ලබා දීමෙන් සහය විය හැකි අතර එමගින් මෙම අංශ වර්ධනය වීමට සහ නවෝත්පාදනය කිරීමට උපකාරී වේ.

(4) **උත්තේජක පැකේජ සහ සමාජ මාරුවීම්:**

රජය මගින් පවුල් වෙත සෘජු මුල්‍ය ආධාර ලබා දීම විරැකියා ප්‍රතිලාභ හෝ ආහාර ආධාර ආදියලබා දීමෙන් ආර්ථික පසුබෑම් අතරතුර වුවද පාරිභෝගික වියදම් ස්ථාවරව තබා ගැනීම සහ දරිද්‍රතාවය අවම කර ගැනීමට උපකාරී වේ.

**(ලකුණු 02 බැගින්, ලකුණු 04)**

**(E)**

(1) අඛණ්ඩ අයවැය හිගය.

(2) වක්‍ර බදු මත අධික ලෙස රඳා පැවැත්ම (ආනයන බදු සහ වැට් බදු සහ සෘජු බදු).

(3) රාජ්‍ය අංශ පුළුල් කිරීම සහ අකාර්යක්‍ෂමතාවය

(4) අධික ණය ගැනීම සහ ණය සමුච්චය වීම.

(5) තාවකාලික සහ දේශපාලනික වශයෙන් අභිප්‍රේරිත ප්‍රතිපත්ති.

(6) ඵලදායී අංශවල ප්‍රමාණවත් ආයෝජන නොමැති වීම .

(7) ප්‍රමාණවත් මූල්‍ය විමධ්‍යගතකරණයන් නොමැති වීම.

(8) දුර්වල ආයතනික ධාරිතාව සහ පාලනය. **(ලකුණු 01 බැගින්, ලකුණු 02)**

**(මුළු ලකුණු 20)**

**C කොටසේ අවසානය**